





27 වන පිටෙන්

නිර්මාණාත්මක ගුණය අතින් කිසියම් සාධනිය ලක්ෂණ කිහිපයක්වත් පෙන්නුම් කරන කාර්යයන් ගනනාවක රංගනයේ යෙදීමෙන් ලැබෙන ප්‍රාගුණ්‍ය සහ නිපුණත්වය  විශිෂ්ඨ නිර්මාණයකට සම්බන්ධ වීමට අවශ්‍ය පසුබිම සකස් කරගැනීමේදී විශාල පිටුබලයක් ලබාදෙන බව අද මා පැහැදිලිවම අවබෝධ කරගෙන තිබෙන වෘත්තීමය කාරණයක්. අතීතයේදී මා එබඳු ප්‍රතික්ෂේප කිරීම් සිදුකළත් අද වන විට එය පසුතැවීමකට කාරණා සපයමින් සිටිනවා. . කෙසේ වුවත් අතිවිශිෂ්ඨ පිටපතකින් පවා දුර්වල නිර්මාණයක් බිහිවන්නට පුළුවන් වගේම දුර්වල පිටපතකින් කිසි කළෙක සාර්ථක නිර්මාණයක් බිහි කරන්නට බැරි බවත් මා විශ්වාස කරනවා. ඒ නිසා මෙය ඉතාම සාපේක්ෂ කාරණයක් බවයි මගේ පෞද්ගලික හැඟීම.

පිටපත ඉතාම සාර්ථක එකක් කියා එකවර නොහැගුණාත් , රංගන ශිල්පියෙකුට චරිතයක් නිරූපණය කිරිමට ලැබෙන අවස්ථාව පාවිච්චි කළ යුතු යැයි මා යෝජනා කරනවා. මන්දයත් රංගනය යනු නිරන්තර අභ්‍යාසය තුලින් යළි යළිත් මුවහත් කළ යුතු ශිල්පයක් විනා න්‍යායාත්මකව පමණක් හැදෑරිය හැකි විෂයයක් නොවන බැවිනි. නිතර අත්හදා බැලීම තුලින් තමන්වම පුහුණු කළ යුතු නිසා පිටපත ඉතා ආකර්ෂණිය නොවුණාත් යම් රංගනයක් ඉදිරිපත් කළ හැකි නිර්මාණයක් නම් එය බාර ගත යුතු යැයි මා අද විශ්වාස කරනවා. අනෙක් කරුණ නම් , බොහෝ නිර්මාණ වල අවසාන ඵලය පිටපත තුලින්ම තීරණය කළ නොහැකියි. අවසන් නිර්මාණය ගොඩනැගෙන්නේ නළු නිළියන්, අධ්‍යක්ෂකවරයා, සංගීත නිර්මාපකයා,කැමරා ශිල්පියා, සංස්කරණ ශිල්පියා වැනි බොහොමයකගේ සහභාගීත්වයෙන්. මෙනිසා කණ්ඩායමක් ලෙස අවබෝධයෙන් කටයුතු කිරීමෙන් ඉතා සාර්ථක නිර්මාණයක් බිහිවන්නට තිබෙන අවස්ථාව ඉහළ බව මගේ පිළිගැනීමයි.

**පසුගිය වසරේ ඔබ හොලිවුඩ් නළු නිළියන් රඟපෑ ජාත්‍යන්තර නිර්මාණයකට සම්බන්ධ වීම සඳහා ඉතාලියේ රෝම නගරය බලා පිටත්ව ගියා. එම කාලසීමාවේදී දේශීය සිනමාව සහ බටහිර සිනමා කර්මාන්තය පිළබිඳව සංසන්දනාත්මක විග්‍රහයක නිසැකවම ඔබ යෙදෙන්නට ඇති. ඔබේ පෞද්ගලික මතය සමාජගත කරන්නට අවැසි නම් ඔබ එය පාඨකයා වෙත ප්‍රක්ශේපණය කරන්නේ කෙබඳු ස්ථාවරයක සිටද?**

**නදී**

එය The Young Pope නමැති ඉංගිරිසි බසින් නිර්මාණය වුණ රූපවාහිනි මාලා නාටකයක්. මෙය Paolo Sorrentino නම් ඉතාලි ජාතික අධ්‍යක්ෂකවරයාගේ නිර්මාණයක්. ඉතිහාසයේ ප්‍රථම වරට වැනිසියේ අන්තර්ජාතික චිත්‍රපට උළෙලට රූපවාහිනී මාලා නාටකයක කථාංග යුගලක් ප්‍රචාරය වීමේ වරම හිමිකරගත්තේ මෙම නිර්මාණයයි. මෙහි ප්‍රධාන චරිත සඳහා Jude Law,Diane Keaton iy Silvio Orlando රංගනයෙන් දායක වුණා. Jude Law යනු ඔස්කාර් සම්මානය සඳහා දෙවතාවක්ම නාම යෝ ජනා වූ අද්විතීය නළුවෙක්. තරුණ පාප්වහන්සේ ලෙස රංගනයේ යෙදුණෙ ඔහු. මා එහි නිරූපණය කළේ සුරී නම් වන කන්‍යා සොහොයුරිගේ චරිතය. ඇත්තෙන්ම මට ඒ අවස්ථාව හිමි වන්නේ සුදර්ශණ බණ්ඩාර නම් වන සහෝදර රංගන ශිල්පියා නිසා. මෙම නිර්මාණයේ සහායක නළුවරණ අධ්‍යක්ෂකවරයා (Assistant Casting Director) ගේ මිත්‍රයෙක් වන ශ්‍රී ලාංකිකයකු සුදර්ශණ වෙතින්  මෙම චරිතයට සුදුස්සකු සොයා දෙන්නැයි ඉල්ලිමක් කර තබුණා. මා ඒ වන විට මෙල්බර්න් නුවර ජීවත් වූ නිසා ඔහු කෞශල්‍යා ප්‍රනාන්දුගෙන් මගේ දුරකථන අංකය ලබාගෙන මට කථා කළා. පිටපතේ ඇතුලත් එක් දර්ශණයක් රඟපා එහි වීඩියෝ පටිය ලැබෙන්නට සලස්වන්නැයි නිශ්පාදන කණ්ඩායම විසින් ඉල්ලා තිබුණා. මා මිත්‍ර වරුණ සාවින්ද්‍රගේ නිවසේදී ඒ අවශ්‍ය කොටස් රූගත කිරීමේදී ඔහුගේ පුත් අනන්ත දර්ශනය සඳහා පාප් වහන්සේ හැටියට රංගනයේ යෙදුණා. ඔහු ඇත්තටම දක්ෂ දරුවෙක්. වරුණගේ බිරිඳ සෙව්වන්දිකාත් සම්පයේ සිට මට විශාල සහයෝගයක් ලබදුන්නා. එම වීඩියෝ පටය නැරඹීමෙන් අනතුරුව මේ චරිතයට මා සුදුසු යැයි ඔවුන් තීරණය කළ බව ඔවුන් දැනුම්දුන්නා.